# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2300/04 - 2022 ඔක්තෝම්බර් මස 03 වැනි සඳුදා - 2022.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : ඉ4/අත්පත්/288/2 වෙළම.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/8/2011/පිසී/25.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගුල් මැදගන්දහය බටහිර කෝරළයේ සුළු කොට්ඨාසයේ වඩුගම යන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2022.08.14 දිනැති වාරි මාර්ග මැනුම් මූලික පිඹුරු 18 හි පත්‍ර අංක 1 අතිරේක අංක 1 සැලසුම්පතෙහි සඳහන් වර්ගඵලය හෙක්ටයාර 1.9862 ක් පමණ වූ පහත විස්තර ලැයිස්තුවේ සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් බිම් කොටස් තුන(03):

මූ.පි. 18

01. **කැබලි අංක 307**
ඉඩමේ නම: වඩුගමයාය; ඉඩමේ විස්තරය: කුඹුර;හිමිකම් කියන්නා: කුමාර පතිරන්නැහැලාගේ රංහාමිගේ කිරිමැණිකා; ප්‍රමාණය: හෙක්ටයාර් 1.0793.

02. කැබලි අංක 308
ඉඩමේ නම: නැත; ඉඩමේ විස්තරය: මාර්ගය;හිමිකම් කියන්නා: කුමාර පතිරන්නැහැලාගේ රංහාමිගේ කිරිමැණිකා; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0537.

03. **කැබලි අංක 309**
ඉඩමේ නම: වඩුගමයාය; ඉඩමේ විස්තරය: කුඹුර;හිමිකම් කියන්නා: කුමාර පතිරන්නැහැලාගේ රංහාමිගේ කිරිමැණිකා; ප්‍රමාණය: හෙක්ටයාර් 0.8532.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2022 නොවැම්බර් මස 15 වැනි දින පෙරවරු 9.00ට නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 නොවැම්බර් මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

රේණුකා පී.විජේරූප,
ප්‍රාදේශීය ලේකම්,
නිකවැරටිය.

2022 සැප්තැම්බර් මස 28 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0003